

තිරුක්කෝවිල්, විනයාගපුරම්, පරණ තැපැල්කන්තෝරු පාර



කුච්චුවේලි, ගෝපාලපුරම් පාරේ කාණු පද්ධතිය

විනායගපුරම් ගම්මානයේ පරණ තැපැල් කන්තෝරු පාර ලෙස හඳුන්වන මෙම පාර ප්‍රතිසංස්කරණය කිරීමෙන් ධීවර ප්‍රජාවට පමණක් නොව එහි වෙසෙන සියලුම පාසල් ළමුන් ඒ පාරේ ගමන් ගන්නා මහජනතාව යනාදී සියලුම දෙනාගේ පැසසුමට හේතු වී තිබෙනවා. විනායගපුරම් මහා විද්‍යාලයේ ශිෂ්‍යාවක වන මහෙන්ද්‍රන් වේනුජා, අප සමඟ මෙසේ කීවාය. ''ඉස්සර නම් වැස්ස දවසක වුණත් මේ පාරෙ පයින් යන්නවත් බැරි තත්ත්වයක් තිබුණේ. ඒ තරමට වළ ගොඩැලි දැන් නම් පාර ගොඩක් හොඳට තියෙනවා. ඉස්සර නම් ඔය වළවල්වල ළමයි වැටිලා තුවාල වෙලත් තියෙනවා. අපේ ඇඳුම් මඩ වෙනවා. දැන් නම් ඒ කිසිම ප්‍රශ්නයක් නැ.''

විනයාගපුරම් පරණ තැපැල් කන්තෝරු පාරේ පදිංචි 32 හැවිරිදි සුන්දරලිංගම් රසිකුමාර් ''මේ පාර හදද්දී ජනතා සහයෝගයත් ඉහළින්ම ලැබුණා. බඩු ටික ආරක්‍ෂා කරලා දුන්නා. පුළුවන් විදිහට හැමෝම උදවුත් කෙරුවා''යි මෙම ව්‍යාපෘතියට තමන්ගෙන් ලැබුණු දායකත්වය ගැන කිවේය.

ත්‍රිකුණාමලයේ තුච්චවේලි ප්‍රදේශය යුද්ධයෙන් හොඳ හැටි බැට කෑ ප්‍රදේශයකි. මෙහි ගෝපාලපුරම් ගම්මානයේ වෙසෙන ජනයාගේ ප්‍රධානම ජීවනෝපාය වූයේ කෘෂිකර්මාන්තය හා සත්ව පාලනයයි. වැසිකාලයේ ඇති වන ගංවතුර මොවුන්ගේ




ජීවනෝපාය දැඩි ලෙස අඩාල කරයි. මෙය මෙහි වැසියන් තුළ තවත් අමතර ගැටලු රැසක් ඇති කිරීමටද හේතුවෙයි.

මෙවැනි පසුබිමක මේ ගැටලුවලට විසඳුම් සොයමින් සිටි ජනතාව වෙත සහ පුර නැගුම වැඩසටහන ළඟා විය. එම වැඩසටහන යටතේ කෙරෙන සංවර්ධන ව්‍යාපෘතියේ පළමු මනාපය කාණු පද්ධතියක් නිර්මාණය විය යුතුය යන යෝජනාව ජනතාවගේ පැත්තෙන් ඉදිරිපත් විය. එම යෝජනාව පිළිගෙන පුර නැගුම යටතේ මේ වසර ප්‍රතිපාදන වෙන් කෙරුණේ එම කාණු පද්ධතිය නිර්මාණය කිරීමටයි.

''වැස්සක් වැහැපු හැටියේ ගමනක් බිමනක්වත් යාගන්ඩ බැරි තරමට යටවෙන පැත්තක් මේක. ඒ වුණාට එළු, මිරිස් වවන්ඩ පුළුවන් පොළොවක් ඒ වගේම මේ ගම්වල මිනිස්සුත් අඩදබර කරගන්නවා. පහුගිය අවුරුදු දෙක තුනේම දිගටම ප්‍රශ්න ඇති වුණා. ඒවා විසඳන්න පොලීසියෙනුත් මැදිහත් වෙනවා. ඒ වගේ ප්‍රශ්න තිබුණු වෙලාවක තමයි ගෝපාලපුරම් ගමට මීටර 350ක් දිග කාණුවක් හදන්න තීරණය කෙරුණේ. දැන් ඒ වැඩේ ඉවරවෙන තැනට ඇවිල්ලා මිනිස්සුන්ටත් ඒ ගැන ගොඩක් සතුටුයි. පුර නැගුම ව්‍යාපෘතිය සාර්ථකවෙලා. එහෙම කිව්වෙ තුච්චවේලි ප්‍රාදේශීය සභාවේ ලේකම් කාදර් මුහයිදීන්

මේ ගමේ ජීවත් වන පවුල් ගණන දෙසීයකි. ගංවතුරෙන් මේ සියලුම පවුල් බැටකති. ගංවතුර නිසාවෙන් වසර දෙකකින් පලදාව නෙලා ගත හැකි ගස්ලබු ගස් මාස දෙකකින් විනාශ වී යයි. එලෙසම එළු වගාවද ඔවුන්ට නිසි ලෙස කරගන්නට නොලැබෙන බව ගෝපාලපුරම් වැසියෝමැසිවිලි නගති.

39 වැනි වියෙහි පසුවන සින්නවන් සුරේෂ් ''වැස්ස කාලෙට ගොවිතැන එහෙම පිටින්ම විනාශ වෙනවා. මල් පැලයක්වත් ගෙදර ඉතුරු වෙන්නෙ නැ. ළමයි ලෙඩ වෙනවා. කෑමක් බීමක් හදා ගන්ඩ නැ. මදුරුවොත් පුදුම විදිහට බෝ වෙනවා. ගෙදර නිදාගන්නවත් හම්බවෙන්නෙ නැ. ගෙයි මිදුල් පවා ගංවතුරෙන් පිරෙනවා. එතකොට අහළ පහළ අය රණ්ඩු කරගන්නවා. තමන්ගෙ වත්තේ වතුර ටික අනුන්ගෙ වත්තට හැරෙව්වාය කියලා. ඉතිං ඒ රණ්ඩු අන්තිමට කෙළවර වෙන්නෙ පොලීසියෙන්'' ඔහු තම අතීත අත්දැකීම් සිහියට නගමින් කීවේය.

''මේ වෙනකොට කාණු පද්ධතියේ වැඩ අවසන් අදියරට ළඟාවෙලා. අපිත් ගොවිතැන් කරලයි තියෙන්නෙ. මේ

පාරවත් ලාබයක් ගන්න පුළුවන්වෙයි කියලා හිතෙනවා. මේ සැරේ නම් ගස්ලබු ගස්වලින් අවුරුදු දෙකක්ම ඵලදාව අරගන්ඩ පුළුවන්වෙයි.'' සුරේෂ් අපත් සමඟ කීය.

58 හැවිරිදි ක්ලමන් පුෂ්පදේවි කතාවට මුල පිරුවේ ගංවතුර නිසා තමන් අල්ලපු ගෙදරත් එක්ක රණ්ඩුවකට පැටලිලා ඒ අය තමන්ට පහර දෙන්න ආව අතීත කතාවක් මතක් කරමින්. ''මිනිස්සු ගං වතුර බස්සන්නේ අපේ ඉඩමෙන්. මේකෙන් අපේ ගොවිතැනයි, සත්තුන්ටයි දෙකටම හානි. උන්හිටි තැන් නැති වුණාම අපි ගිහින් ඉස්කෝලෙත් නැවතිලා හිටියා. අපේ විතරක් හරක් දොළොස් දෙනෙක් මළා. තවත් හරක්පට්ටි අයිතිකාරයෙකුගෙ හරක් හතළිහක් ම මළා. අපි ගොවිතැන් කරන්ඩ ලක ලැහැස්ති කරලා තියෙන වගා බිමක් අනිත් අය මෙහෙට ගං වතුර හැරෙව්වහම යටවෙලා, ඒකෙ තියෙන පොහොර ටිකක් ගහගෙන යනවා. ඊට පස්සෙ ගොවිතැන් කෙරුවත් පාඩුවක්ම තමයි සිද්ධවෙන්නේ'' ඇය කීවාය.

මේ ප්‍රදේශයට වාහන යාම් ඊම් කරන අතර, රෙදිවිවීම් කර්මාන්ත ශාලාවක්ද, සත්ව රෝහලක්ද පිහිටා තිබේ. ඒ වෙත පවා ගෙවල් යට වී යන තත්ත්වයක්. ඉහත කී පාර අඩි පාරක් ලෙස තිබූ නිසා පාසල් ළමෝද රස්සාවකට යන එන අය ද දැඩි දුෂ්කරතාවලට මුහුණ දුන්හ. එම නිසා ප්‍රදේශයේ ජනතාවගේ ප්‍රමුඛතාව ලැබුණේ මෙම මාර්ගය හොඳින් හදාගන්න ඕනය යන කරුණටයි. මෙය ප්‍රබල අවශ්‍යතාවක් බව වටහාගෙන කොන්ක්‍රීට් මාර්ගයක් ලෙස නිර්මාණය කිරීමට තීන්දු විය.

පසුගිය වසරේ මාරාන්තික ඩෙංගු රෝගයෙන් ප්‍රදේශවාසීන් කිහිප දෙනෙකුම පීඩාවට පත් වූහ. එයට මෙම මාර්ග පහසුකම සැලසී නොතිබීමද හේතුවක් වූ බව ප්‍රදේශවාසීන් පැවසූහ. එහෙත් මෙවර පුරනැගුම ව්‍යාපෘතියෙන් කොන්ක්‍රීට් පාරක් ලෙස මෙය සකසා ඇති බැවින් මෙම වසරේදී ඩෙංගු අනතුරෙන් බේරීමට ප්‍රදේශවාසීන්ට හැකි වනු ඇතැයි ඔවුහු විශ්වාස කරති.

මෙහි ජීවත් වන 30 හැවිරිදි පලතුරු වෙළෙන්දෙකු වන හනීෆා මුහමඩ් නුවෙස් ''ඉස්සර මේ පාරෙ ගොඩක් කුණු දකින්න තිබුණා. ගිය අවුරුද්දෙ මෙහේ ගොඩක් දෙනෙක් ඩෙංගුවලට ගොදුරු වුණා වගේම සමහරු මැරුණා. මෙහේ අයට පල්ලියට යාගන්නත් පාලම පහු කරගන්නත් සැහෙන්න


කාදර මුහෙදීන්


පුෂ්පා දේවි


සුරේෂ්


රුවෙස්



මෙහි ජනතාව යන්නෙ එන්නෙ මේ ගෝගලපුරම් පාරෙනි. එම නිසා එය යට නොවන ලෙස කාණු පද්ධතියක් නිර්මාණය වීමෙන් තමන්ට සෙතක් සැලසේවි යැයි ප්‍රදේශවාසීහු විශ්වාසය පළ කරති.

කාණු පද්ධතිය හැදෙමින් තිබුණු අවස්ථාවේ ඒ වැඩවලට අවශ්‍ය වතුරත්, වැඩ කරන අයට තේ ද ලබා දී තිබේ. එසේම කාණු කැපීමෙන් ගොඩ ගැසෙන පස් තුනී කිරීමටද ප්‍රදේශවාසීන් හවුල් වී තිබේ. කාණු පද්ධතියේ වැඩ අවසානයක් කරා ළඟා වී ඇති මේ මොහොතේ ඉන් ඉදිරියට අවතැන් නොවී සැනසිල්ලේ තම ඉඩම්වලම ජීවත්වෙන්නට හැකිවේවිය යන විශ්වාසය උඩ ඔවුහු සැනසුම් සුසුම් හෙළති.

ධීවර ප්‍රජාව බහුලව වෙසෙන ප්‍රදේශයක් වන කින්නියා නගර සභාවට අයත් අඩප්පනාරු පාර ගඟ අයිනේ පිහිටා තිබේ. මීට පෙර මෙහි තිබුණේ සාමාන්‍ය ගංවතුර තත්ත්වයක් යටතේ අමාරු වුණා. දැන්නම් ගොඩක් අය මේ පාර පාවිච්චි කරනවා. දැන් මේක පවුල් 250ක් විතර ප්‍රයෝජන ගන්න පාරක් වෙලා''යි ඔහු සිය සතුට පළ කළේය.

මේ අනුව පුර නැගුම වැඩසටහන යටතේ නැගෙනහිර පළාතේ බොහෝ ව්‍යාපෘතීන් ජනතාවගේ ජීවන තත්ත්වය නැංවීමට ක්‍රියාත්මක කර තිබුණද, ඉහත සඳහන් කළ ව්‍යාපෘතීන් ඒ අතර ප්‍රශස්ත තත්ත්වයක තිබෙන බව පුර නැගුම නිලධාරීහු සඳහන් කරති. එම ව්‍යාපෘතීන් මඟින් ජනතාවටත් විශාල සේවයක් සිදුව තිබෙන බව ඔවුන් දක්වන අදහස්වලින් පැහැදිලිවෙයි.

වෙනත් වයාපෘතීන් මෙන් සංවර්ධනය පමණක් ඉලක්ක කොට නොගෙන, ජනතාවගේ ජීවනෝපායන්, ඔවුන්ගේ යටිතල පහසුකමත් වර්ධනය කරන වැඩපිළිවෙළේ කොටසක් වශයෙනුත් පුර නැගුම ප්‍රසිද්ධියට පත්ව තිබෙනවා. එසේම මෙම වැඩසටහන ඔවුන්ගේ අර්ථිකය ද වර්ධනය කර ඇතැයි කිව හැකිය. ■






## වැඩසටහනේ ප්‍රසම්පාදන ක්‍රමවේදය

මුලින්ම ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා අදාල කළමනාකරණ සහකාරවරයා සමඟ මේ පිළිබඳ සාකච්ඡා කිරීමෙන් පසුව, ප්‍රසම්පාදන කමිටුව (Procurement Committee) හා තාක්‍ෂණික තක්සේරු කමිටුව ස්ථාපිත කරනු ලබනවා.

අනතුරුව තාක්‍ෂණික තක්සේරු කමිටුව (Technical Evalution Committee) සැලසුමක් සකස් කරනවා. එය අනුමත වූවායින් පසු එයට අදාළ නිර්මාණ වාර්තාවක් (Building Document) පිළියෙළ කරනවා. අනතුරුව එය තාක්‍ෂණික තක්සේරු කමිටුව වෙත ඉදිරිපත් කළ යුතුයි. එය ඔවුන් ව්‍යාපෘති කැඳවුම් කමිටුව වෙත යොමු කරනවා. එම කමිටුවෙන් අදාළ ව්‍යාපෘතිය අනුමත වීමෙන් පසුව එය සහකාර ව්‍යාපෘති අධ්‍යක්‍ෂ වෙත යොමු කෙරෙනවා. ඔහුගේ නිරීක්‍ෂණයෙන් පසුව ඔහු එය ව්‍යාපෘති අධ්‍යක්‍ෂ (Director) වෙත යොමු කරනු ලබනවා. ඔහු එය ලෝක බැංකුවේ අනුමැතිය සඳහා යොමු කරනවා.

එම ව්‍යාපෘතියට ලෝක බැංකු අනුමැතිය ලැබී ඇත්නම් ඒ බව පළාත් පාලන සහකාර කොමසාරිස්වරයා වෙත ව්‍යාපෘති අධ්‍යක්‍ෂවරයා විසින් දනුම් දෙනු ලබනවා. ඒ සමඟම පළාත් පාලන සහකාර අධ්‍යක්‍ෂවරයා අදාළ ව්‍යාපෘතිය පිළිබඳ පුවත්පත්වල පළ කළ යුතු දැන්වීම ලබාදෙනවා. ඒ දැන්වීම අපි භාෂා තුනෙන්ම පළ කරනවා. ඒ වගේම ඉල්ලුම්පත්‍ර යොමු කිරීමට දවස් 49ක් කල් දෙනවා.

ඒ අතර තුරේ ප්‍රසම්පාදනයට අදාළ වැඩකටයුතු අවසන් කළ යුතු වෙනවා. දවස් 21 ක් ඇතුළත ලන්සු (Bid) තැබීමට අනුමැතිය ලැබ, ඉල්ලුම් කරන ඉල්ලුම්කරුවන් වෙත අයැදුම්පත යොමුකර එය ලියාපදිංචි කරනවා.

ඔවුන් තම අයැදුම්පත අතින් ගෙනවිත් ඒ සඳහා වෙන් කර ඇති පෙට්ටියට දමනවා. එම අයදුම්පත් විවෘත කර ඔවුන්ගේ නම් ලිපිනය, අයැදුම් ඇපය යනාදිය විවෘත කර, ඔවුන්ගේ නම් ලිපිනය, අයැදුම් ඇපය යනාදිය පරීක්‍ෂා කර බලනවා. ඉල්ලුම්පත්‍ර හැමෝටම දුන්නත් පිළිගත් ඒවා පමණක් වෙන්කර ගන්නවා. මුල් පිටපත පමණක් විවෘත කර පරීක්‍ෂා කරනවා. එහි පිටපත විවෘත කරන්නේ නෑ. සෑම ලිපිගොනුවක්ම තාක්‍ෂණික තක්සේරු කමිටුව (Technical Evalution Committee) එකට යොමු කරනවා.

එය තක්සේරුවට භාජනය කරන තක්සේරු කමිටුව දවස් හතක් ඇතුළත තක්සේරු වාර්තාවක් සකස් කරනවා. අනතුරුව ලන්සු ලේඛනය (Bid Document) ප්‍රසම්පාදන කමිටුව වෙත (Procument Committee) වෙත යොමු කරනු ලබනවා. එහි යම් වෙනසක් කළ යුතුව තිබුණොත් ඔවුන්ට එය කළ හැකියි. අවසානයේ එය ඔවුන් සභාපතිවරයා වෙත එය භාර දෙනවා. ඔහු එය සියලු දෙනාගේම රැස්වීමක් හමුවේ කියවනවා. අනතුරුව ඊට සියලු දෙනාම අත්සන් තබා ඒ බව තෝරා ගත් පාර්ශ්වය වෙත දැනුම් දෙනු ලබනවා. තෝරා ගැනුණු එම පාර්ශ්වය විසින් තමන්ගේ අයැදුම් ඇපය ඉදිරිපත් කර, නියමිත කාලසීමාව එනම් දින 49 ක් ඇතුළත එය අවසන් කළ යුතුයි. එසේ නොවුණහොත් එම ගිවිසුම අවලංගු වෙනවා.

ගිවිසුමට අත්සන් තැබීමෙන් පසු ඔවුන් අදාළ ව්‍යාපෘතියේ වැඩ ආරම්භ කර පවත්වාගෙන යා යුතුයි. එසේම ප්‍රසම්පාදන සැලැස්ම (Procurement Plan) අනුව ඔවුන් එය අවසන් කළ යුතුයි.

## අභිමානවත් පුර නැගුම




හිත ගිය ආකර්ෂණයෙන් අවදිව
ලස්සන මනමත්ව සිටියි ලෝකය !
රුදුරු බවේ හස්තයට හසුව
ගෙවූ වහල් සමය අවසන්
උදා වී ඇහ නාඳුනන අවස්ථාවක්

දේශයේ හිමිකමක් වූ සමෘද්ධිය
වෙත හා ඔසවන ගමනේදී හිමිවුණ
අභිමානවත් පුර නැගුම
සැනසුම් සුසුම් හෙළන
ලක් ජන මන තුළට
හීයක් සේ වැදෙන සතුට
පුදුමයක් නොව, සත්‍යයේ උල්පතකි එය

ලොවෙහි අසරණය ලොවම
සිඳුණු හදවත් තෙතබරිතකොට
වියළි දිව තෙමාලන්ට
දිය බිඳක් ලෙසින් එන
සංවර්ධනයක මහිමයකි ඒ...

මැටි බොරළු පාර යුගය අවසන
දිලිසෙන රතුපලස මත
පා නගන්නට
රටට ඔබින මං තැනෙයි
සංවර්ධනයේ මහිමයෙන් !

දසමසක් කුස දරා
පත්තියම් වී හිඳ
සෞඛ්‍ය මධ්‍යස්ථානවල
සෞඛ්‍ය ගැන නොබැලූ අම්මාවරුණේ..
ඔබේ යහපත තකා
උපදියි සෞඛ්‍ය මධ්‍යස්ථාන පැටවුන්
සංවර්ධනයේ මහිමයයි ඒ ...!

අඳුරු දිවි එළිය කර
මිහිකතෙහි දනන් හිමි මහ
රන් කිරුළක් පැළඳවෙයි
සංවර්ධනය නම් උස් වූ ඒ
කිරුළ ''පුර නැගුම'' නම් වේ

■ පදවිය ශ්‍රී පුර - ප්‍රාදේශීය සභාව

# සමාජ විගණනය හා විගණන කණ්ඩායම්

■ **අන්බලගන් කෲස්** (ප්‍රජා මධ්‍යස්ථාන නිලධාරී, මඩකළපුව)

සමාජ විගණනය යනු සමාජය විසින් තමන්ට සලසන සේවය, එසේත් තැනහොත් තමන්ට සේවා සලසන ආයතනය නිරීක්ෂණය කිරීමේ ක්‍රමවේදයකි. එනම් ප්‍රාදේශීය සභාවත් මහජනයා විසින් නිරීක්ෂණ කිරීම කළ හැකිය. නැතහොත් මාර්ග ඉදිකිරීම් ව්‍යාපෘතියක් මහජන කමිටුවක් විසින් නිරීක්ෂණයට ලක් කළ හැකිය.

මහජනයාට සලසන සේවාව හොඳින් සැලසීමටත්, තමන්ට ලැබෙන සේවවේ තත්ත්වය සහතික කර ගැනීමටත් සමාජ නිරීක්ෂණය අවශ්‍යවේ.

මේ සඳහා සමාජ මට්ටමේ සංවිධාන තමන්ව සූදානම් කර ගනිමින්. තමන්ගේ ම සාමාජිකයන් කිහිප දෙනෙකුගෙන් සමන්විත සමාජ විගණන කමිටුවක් නිර්මාණය කරගත යුතුයි. කිහිප දෙනෙකු යනු පස් දෙනෙකු හෝ හය දෙනෙකු විය හැකියි. මේ සාමාජිකයන් තරමක හෝ ගණකාධිකරණ හා තාක්ෂණික දනුමෙන් යුක්ත අය වීම හොඳය. එසේම කැපවීමත්, එඩිතරකමත්, නිරීක්ෂණයත් අඩු පාඩු සොයා බැලීමේ මානසිකත්වයත් ඇති අය නම් වඩා හොඳය. ස්වේච්ඡාවෙන් වැඩකිරීමේ සූදානමක් ඔවුන් තුළ තිබිය යුතුය. ගමේ තිබෙන ප්‍රජා මධ්‍යස්ථාන ග්‍රාම සංවර්ධන සමිති බඳු සමාජ මට්ටමේ සංවිධානවලට මෙවැනි සමාජ විගණන කමිටු නිර්මාණය කරගත හැකියි.

මේ සමාජ විගණන කමිටුවලට ජනතාවට සේවා සපයන පළාත් පාලන ආයතන වැනි රාජ්‍ය ආයතන නිරීක්ෂණය ඒ පිළිබඳ තම වාර්තා ලබා දිය හැකිය. ඒ ආකාරයටම ව්‍යාපෘතියක් අධීක්ෂණය කර එය ගුණාත්මකභාවයකින් සිදු කෙරෙන බව සහතික කළ හැකියි.

සමාජ විගණන කමිටුවලට තම අදහස් වාර්තාවක් ලෙස හෝ ලිපියක් වශයෙන් හෝ දුරකථනයෙන් හෝ කෙළින්ම අදාළ පාර්ශ්වයන් වෙතට හෝ ප්‍රසිද්ධ රැස්වීමකදී හෝ ව්‍යාපෘතියට සම්බන්ධ ආයතනය වෙත දනුම්දීමට හැකියාව තිබේ. 'ජනප ලකුණු සටහන' නම් වන අලුත් මෙන්ම විශේෂිත ක්‍රමය මඟින්ද එය දනුම්දීමට කටයුතු කිරීමට හැකියාව තිබේ.

මේ අටියෙන් ගත් කල මෙරට පළාත් පාලන ඉතිහාසයේ මෙවැනි ක්‍රම වේදයක් පළමුවරට හඳුන්වා දෙනු ලැබුවේ මෑතකදී ය. විශේෂයෙන් පුර නැගුම වැඩසටහන මඟින් උතුරු නැගෙනහිර පළාත්වල මෙකී සමාජ විගණන කමිටු නිර්මාණය කිරීමට එකී පළාත් පාලන ආයතනවල ඉඩහසර විවෘත විය. පුර නැගුම වැඩසටහන මඟින් ක්‍රියාවට නැගෙන සෑම උප ව්‍යාපෘති වෙනුවෙන්ම සමාජ විගණන කමිටු පිහිටුවා තිබේ. එකී කමිටු තම ගම් ප්‍රදේශවල ක්‍රියාත්මක කෙරෙන යටිතල පහසුකම් ගොඩ නැංවීමේ සෑම ව්‍යාපෘතියක්ම නිරීක්ෂණයට ලක් කර තිබේ.

මෙකී නිරීක්ෂණ හා අධීක්ෂණ ක්‍රියාදාම නිසාවෙන් ක්‍රියාත්මක වෙමින් තිබෙන ව්‍යාපෘතීන්වල අඩුපාඩු රැසක් හඳුනාගෙන ඒවා නිවැරදි කරන්නට මඟපාදා තිබේ. නිදසුනක් වශයෙන් මඩකළපු දිස්ත්‍රික්කයේ සමාජ විගණන කමිටු ක්‍රියාකාරිත්වයන් කිහිපයක් හඳුනාගත හැකියි.

ඒරාවූර්පත්තු ප්‍රාදේශිය සභාව විසින් උරුගාමම් නවගම්මාන පාර හදන අවස්ථාව කොන්ක්‍රීට් මිශ්‍රණ සඳහා ගඟේ වැලි යොදාගත්විටත්, කොන්ක්‍රීට් එකට සුදුසු ලොකු කැට වැලි යොදා නොගෙන බිත්ති කපරාරුවට ගන්නා හීන්වැල්ල ගෙනවිත් තිබියදීත් සමාජ විගණන කමිටු ඒවා හඳුනාගෙන වහාම එය ව්‍යාපෘති තක්සේරු කමිටුව වෙත වාර්තා කරන්නට යෙදුණි. වහාම ක්‍රියාත්මක වූ එම කමිටුව වැඩබිමට ගොස් පරීක්ෂා කර බලා ලොරි දොලක ගං වැල්ල ආපසු හරවා ඒ වෙනුවට හොඳ තත්ත්වයේ කොන්ක්‍රීට්වලට සුදුසු වැලි ගෙන්වා ගැනීමට කටයුතු යොදනු ලැබීය

මන්මුණෛ දකුණ එරුවිල්පත්තු ප්‍රාදේශීය සභාව විසින් එරුවිල් ගම්මානයේ කනත්ත පාර පිළිබඳ තීරණ ගැනීමේදී වැව් ආසන්න ප්‍රදේශය ගංවතුරට යටවන හෙයින් පාර අබලන් වනු ඇතැයි යන්න සමාජ විගණන කමිටුව විසින් පෙන්වා දෙනු ලැබීය. රැස්වීම්වලදී මේ පිළිබඳ විස්තර ඉදිරිපත් කරමින් ව්‍යාපෘති තක්සේරු කමිටුවට වැඩබිමට පැමිණ පරීක්ෂා කරන්නැයි ඉල්ලා සිටියේය. එහි ප්‍රතිඵලයක් වශයෙන් වැව පැත්තෙන් ආරක්ෂක බැම්මක් ඉදිකරවීමට කටයුතු යෙදීය.



උරුගාමම් නගගම්මාන පාර හැදෙමින් තිබූ අවස්ථාව





එරුවිල් කනත්ත පාර හදන අවස්ථාව ...

ඒරාවූර් නගර සභාව විසින් ඒරාවූර් - 05 වීරපත්තිරර් කෝවිල් පාර නිර්මාණය කළ අවස්ථාවේ කෝවිල් හන්දියේ දීර්ඝ කාලයක සිට විසල් ලෙස වර්ධනය වී තිබූ බෝ ගසත්, එම ගස යට පිහිටා තිබූ කුඩා පුල්ලයාර් කෝවිලත් එම ස්ථානයෙන් ඉවත් නොකර සිටින ලෙස සභාපතිවරයාගෙන් එම ගම්මානයේ සමාජ විගණන කමිටුව ඉල්ලා සිටින්නට විය. සමාජ ආරක්ෂාව සහ පරිසර සංරක්ෂණය යන කාරණා දෙකම එකට බැඳී තිබුණු එම ඉල්ලීම මැනවින් වටහාගත් සභාපතිවරයා අලි සාහිර් මෞලානා තරමක අමතර වියදමක් දරමින් හෝ බෝගසත් කෝවිලත් යන දෙකම මැදිකර ජනතාවට පාර තනාදීමට කටයුතු යෙදීය.

මේ ආකාරයට සමාජ විගණන කමිටුවේ කටයුතු රැසක් ම පෙළ ගැස්වීමට පුළුවන. සෑම ගම්මානයකම සමාජ විගණන කමිටුව බැගින් පිහිටුවිය යුතුය යන්න සම්බන්ධයෙන් මඩකළපු දිස්ත්‍රික් පළාත් පාලන සහකාර අධ්‍යක්ෂිකා න. සත්‍යානන්දි මහත්මිය දැඩි උනන්දුවකින් ක්‍රියාකරමින් සිටින්නීය. මේ නිසාම මඩකළපු දිස්ත්‍රික්කය තුළ මේ වන විට ස්ථාපිත කර ඇති සමාජ විගණන කමිට ගණන 290කි. මෙයින් මේ වන විටත් ක්‍රියාත්මක වෙමින් තිබෙන හා අවසන් කළ ව්‍යාපෘතීන් ලෙස සැලකිය හැකි 2011 වසරේ ව්‍යාපෘතීන් 30කටත් 2012 දී ව්‍යාපෘතීන් 46කටත්, 2013 දී ව්‍යාපෘතීන් 24කටත් වශයෙන් ව්‍යාපෘතීන් 100කදී සමාජ විගණන කමිටුව තම ඉහළම දායකත්වය ඉතා හොඳින් ලබාදී තිබෙන අතර, තවමත් ලබා දෙමින්, ඉදිරියටත් ලබා දීමට සූදානමින් සිටී.

මේ අතර අලුත් සහ විශිෂ්ට උත්සහයක් ලෙසින් මන්මුණෛ නිරිතදිග ප්‍රාදේශීය සභාවේ සේවා සැපයුම් හැකියාව පිළිබඳ සමාජ විගණන කමිටුව විසින් තක්සේරු කොට 'සමාජ ලකුණු සටහනක්' සකසා එය එම ප්‍රාදේශීය සභාව වෙතත් මඩකළපු දිස්ත්‍රික් පළාත් පාලන සහකාර කොමසාරිස් වෙතත් ලබා දී තිබේ.

පෝරතීවුපත්තු ප්‍රාදේශිය සභාවේ කුම්බලවත්ත මාණික්ක පුල්ලයාර් කෝවිල් පාර එම ප්‍රදේශයේ සමාජ විගණන කමිටුව විසින් තක්සේරු කර එයට අදාළ 'සමාජ ලකුණු සටහනක්' සකස් කර තිබෙනවා.



ඒරාවූර් වීරපුත්තිරර් කෝවිල් පාර හැදෙමින් තිබිය දී...

මේ ආකාරයෙන් සමාජය විසින් තමන්ට සේවා සපයන ආයතනයත් පිළිබඳ සමාජ ලකුණු සටහන් පිළියෙල කර, එය පොදු ස්ථානවල දැවැන්ත පුවරු ලෙස ප්‍රදර්ශනය කරවීමට කටයුතු කළ යුතුයි. එම ලකුණු සටහනේ ඇත්ත තත්ත්වය අදාළ ආයතනය විසින් වටහා ගැනීමත්, ඒ අනුව තම කටයුතු හැඩගස්වා ගැනීමත් කළ යුතුය. ඊළඟ සමාජ ලකුණු සටහන සැකසෙන විට එකී වෙනස පැහැදිලිව පෙනෙන්නට තිබිය යුතුය.

මෙලෙස මහජනයාත්, පළාත් පාලන ආයතනත් එකට එක් කරන, පළාත් පාලන ආයතන කෙරෙහි මහජන විශ්වාසයත් ගොඩනගන පළාත් පාලන ආයතනවල යහපාලනය ස්ථාපිත කරන අවස්ථාවක් ලෙසත්, ගුණාත්මක සේවයක් සහතික කරන උපාය මාර්ගයක් ලෙසත්, කොන්ත්‍රාත්කරුවන් අධීක්ෂය කරන ක්‍රමවේදයක් ලෙසත් පුර නැගුම වැඩ සටහන සමාජ විගණන නමින් අලුත් හැරවුම් ලක්ෂයක් පාලනය තුළ නිර්මාණය කර තිබෙනවා. ■



හිමානි අමරතුංග

# නිලධාරීන්ගේ හැකියා වර්ධනය හා පුර නැගුම වැඩසටහන

පුර නැගුම වැඩසටහන තුළ පළාත් පාලන ආයතන ඇතුළත්වීමට නම් පැහැදිලිවම එම ආයතන පුහුණුවලත් නිලධාරීන්ගෙන් සමන්විත විය යුතුයි. එය එසේ වීමට නම් පළාත් පාලන ආයතනවල නිලධාරීන්ට මූල්‍ය කළමනාකරණය, සැලසුම්කරණය හා පරිපාලනය යන සියලුම ක්ෂේත්‍රවලට අවශ්‍ය වන පුහුණුව පුර නැගුම වැඩසටහන යටතේ ලබාදිය යුතුය යන්න මේ වන විටත් ප්‍රායෝගිකව ක්‍රියාත්මක කරනු ලබන වග විශේෂයෙන් සඳහන් කළ යුතුය.

පුර නැගුම යටතේ සේවකයනට ලබා දුන් පුහුණුව ඔවුන් තුළ වෙනසක් ඇති කර තිබෙනවා. එසේම පළාත් පාලන ආයතනයන්ගේ පරිපාලනය තුළත් වෙනස්කම් ඇති කර තිබෙනවා. නිලධාරින් තුළ යහපත් ගුණාංග ඇති කර තිබෙනවා. නායකත්වය ගෙන ක්‍රියා කරන අයට හොඳ වගකීම් භාර දී තිබෙනවා. මේ නිසා මේ සෑම පාර්ශ්වයක්ම තමන්ගේ ජීවිත අර්ථවත් කරන්නට පුර නැගුම සමත්ව ඇති වග වටහාගෙන ඊට කෘතවේදී වෙමින් සිටිනවා. තව කොපමණ ව්‍යාපෘතීන් සංඛ්‍යාවක් වුවත් කිසිඳු පැකිලීමකින් තොරව ඉතා හොඳින් ක්‍රියාත්මක කිරීමේ හැකියාව පුර නැගුමෙන් තමන්ට ලැබී ඇතිවග ඔවුහු පවසති. පහත ගොනුවන්ගේ එබන්දන් කිහිප දෙනෙකුගේ අදහස් මේ. ''පුර නැගුමෙන් අපේ හැකියාවන් ධාරිතාවන් (Capacity) වර්ධනය කරගන්නට අවශ්‍ය පුහුණුව ලබා දෙන පන්ති පවත්වලා තියෙනවා. ව්‍යාපෘතියක වැඩ කොටස් කෙරෙන්න ඕන මොන විදිහටද කියන කාරණය පැහැදිලි කරන සාකච්ඡා පුහුණු වැඩමුළු අපට හොඳ මග පෙන්වීමක් ලබා දුන්නා. මේ නිසා අනාගතයේදී වඩාත් හොඳින් වැඩ කරන්න පුළුවන් තත්ත්වයට අද අපි පත්වෙලා තියෙනවා.'' මෙහෙම කිව්වෙ මන්මුණෛපත්තු ප්‍රදේශීය සභාවේ පළාත් පාලන සහකාර ලෙස කටයුතු කරන දුරයප්පා ඉලංකෝ

''මේ පුර නැගුම වැඩසටහනේ මිලදී ගැනීම් ක්‍රියාත්මක කිරීම භාරව කටයුතු කරනවා. මුලදී මට මිලදී ගැනීම් ගැන තිබුණේ පුංචි දැනුමක් විතරයි. දැන් ඒ දැනුම වර්ධනය කරගන්න අවස්ථා ලැබිලා තියෙනවා. ඒකට හේතු වුණේ පුර නැගුම වැඩසටහනයි. මට දැනෙන විදිහට මගේ ක්ෂේත්‍රයේ සියයට 90 ක විතර දැනුමක් මට ලැබිලා තියෙනවා.

ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කරන්නට කලින් කරන්න ඕන දේවල් මොනවද මොනවගේ ක්‍රමවේදයක් ද අනුගමනය කරන්න ඕන. යනාදි කාරණා පුර නැගුම තමන්ට කියා දුන් බවත් මීට පෙර ක්‍රියාත්මක වූයේ කුඩා ව්‍යාපෘති නිසාවෙන් සුළු ප්‍රාග්ධනයක් තබාගෙන ප්‍රජා මධ්‍යස්ථාන සෲ වැනි ආයතන මඟින් සුළු ව්‍යාපෘති ක්‍රියාත්මක කළ නිසා තමන්ට ඒ කාලෙ ලැබුණොත් සුළු දැනුමක් බව ඔහු වැඩිදුරටත් අප සමඟ කීවේය.

''මිල ගණන කැඳවීම (Bid) උපයෝගී කරගෙන පත්තර දැන්වීමක් මඟින් ව්‍යාපෘතියක් කරන්නෙ ක්‍රියාත්මක කරන්නෙ මොන විදිහට ද කියලා අපි දැනගත්තෙ පුර නැගුම වැඩසටහන ආවට පස්සෙයි. ප්‍රසම්පාදන (Procurement) මොන විදිහටද ක්‍රියාත්මක වෙන්නෙ කියන දේ අපි පුර නැගුම යටතේ ලැබුණු පුහුණුවෙන් තමයි දැනගන්නෙ. ඒ වගේම ඒකෙන් ප්‍රසම්පාදන (Procurement) ගැන වැඩිපුර දැනුමක් අපට ලබාගන්නත් අවස්ථාව ලැබුණා''යි ඉලංකෝ කියයි.

නින්දවූර් ප්‍රාදේශීය සභාවේ පුර නැගුමේ වැඩසටහනේ ප්‍රසම්පාදන කටයුතු භාරව ක්‍රියාකරන පළාත් පාලන සහකාරවරියක වන උම්මු සල්මා මුහම්මදු සහාර් පුර නැගුම වැඩසටහන යටතේ පළාත් සභාවකට අවසර තියෙන්නේ රුපියල් මිලියන පහේ ඉඳලා දහය වෙනකම් වැය කරන්ඩ පුළුවන් ව්‍යාපෘතිවල විතරයි. ප්‍රාදේශීය සභාව ප්‍රසම්පාදන වැඩ කරගන්න ඕන මේ සීමාව ඇතුළෙයි. අපි අවුරුද්දක සැලසුමක් ඉදිරිපත් කරද්දි ඒකට අනුමාන වෙලා එන මුදල කොච්චරද කියලා බලලා ඒක රුපියල් මිලියන 5-10 ක් නම් විතරයි අපි ටෙන්ඩර් කැඳවීම් වැඩ පටන්ගන්නෙ'' යි ඇයි ඔවුන්ට ඇති සීමාව පිළිබඳ පැහැදිලි කරන්නට වූවා ය.

''මුල දී නම් ප්‍රසම්පාදනය ගැන මට සාමාන්‍ය දැනීමක් විතරයි තිබුණේ. ඒත් අපට ලැබුණු පුහුණුවෙන් පස්සෙ, ප්‍රසම්පාදනය ගැන අපට හොඳ දැනුමක් ලැබුණා. ඒකට උදව් කෙරුවෙ පුර නැගුම. ඒ වගේම අනිත් අයගෙන් උදව් ඇතිව මට පුළුවන් වුණා ප්‍රසම්පාදනය කියන්නෙ මොකක්ද කියන එක සම්පූර්ණයෙන්ම අවබෝධ කරගන්න'' ඇය තවදුරටත් අප සමඟ කීවාය.





දුරයප්පා ඉලංකෝ



උම්මු සල්මා



ජෙයාකීන්



නිලාන් සාගර



පරිෂාබි

පුර නැගුම වැඩසටහන යටතේ මුත්තූර් ප්‍රාදේශීය සභාවේ සේවය කරන නිලධාරීන් පස්දෙනෙකුට පුහුණුව ලබා දී තිබෙනවා. මෙම පුහුණුව ලැබූ මුත්තූර් ප්‍රාදේශීය සභාවේ ප්‍රජා සංවර්ධන නිලධාරී පුණ්‍යමූර්ති ජෙයාකරන්, තමන්ට ලැබුණු පුහුණුව ගැන කතා කරමින් මෙසේ කීවේය. ''පුර නැගුම වැඩසටහනෙන් මිනිස්සුන්ගෙ ප්‍රශ්න අඳුරගෙන ඒවාට විසඳුම් හැටියට ව්‍යාපෘති සකස් කරන්නෙ කෙසේද යන්න පිළිබඳ පුහුණුවක් ලබා දුන්නා. මුලින්ම ග්‍රාම සංවර්ධන සැලසුම් (Village Development Plan) සකස් කරන්නෙ කොහොමද කියන එක, ඊළඟට ඒක පදනම් කරගෙන සකස් කරන පළාත් පාලන ආයතන සඳහා වන ජනතා සහභාගිත්ව සංවර්ධන සැලසුම් (Local Authority Participatory Development Plan) පිළිබඳ පුහුණුවක් කළමනාකරණ පීඨය මඟින් රාජ්‍ය නොවන සංවිධානයක් මඟින් අපට ලබාදුන්නා.'' යනුවෙන් පැවසීය.

''GI' ආයතනය මඟින් ජනතා පැමිණිලිවලට



සවන්දීමේ ක්‍රමය (LAGRM) සම්බන්ධයෙන් මොවුන්ට පුහුණු සැසි හතක් පවත්වා තිබෙනවා. ජනතා පැමිණිලිවලට සවන්දීමේ ක්‍රමය සෙසු තැන්වලත් ක්‍රියාත්මක වුවද, මුත්තූර් ප්‍රාදේශීය සභාව තුළ එය අනෙකුත් තැන්වලට වඩා ටිකක් දියුණු විදිහටයි. එනම් පැමිණිල්ලක් ලැබුණු විට ඒ පිළිබඳ සොයා බලා කටයුතු කරන්න කමිටුවක් පත්කරනවා. එම කමිටුව පළාත් පාලන (Council) මට්ටමින් ප්‍රශ්නයකට විසඳුම් සොයන්නෙ කෙසේ දැයි කටයුතු ක්‍රියාත්මක කරනවා. එතැනින් නොනැවති වැඩබිම පිළිබඳ සොයා බලන්නටත් මොවුන්ව යොමු කෙරෙනවා. ජනතා පැමිණිවලට සවන්දීමේ ක්‍රමයෙන් මොවුන්ට ලැබෙන පැමිණිලි හා සැලසුම් මත ඉදිරි අය වැය යෝජනාවලින් ලබා ගත හැකි ලියාපදිංචි සටහනක් පවා මොවුන් සූදානම් කරගෙන තිබෙනවා.

ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ ජනතා පැමිණිලිවලට සවන්දීමේ ක්‍රමවේදය ප්‍රශස්ත ලෙස ක්‍රියාත්මක කරන සභාව යන ඇගයීම සෝබා ආයතනය විසින් මොවුන් වෙත ලබා දී තිබෙනවා. මේ ඇගයීම මොවුන්ගේ මනා ක්‍රියාකාරිත්වයට ලැබුණු පිළිගැනීමක් ලෙස සැලකිය හැකියි.

අපට ප්‍රසම්පාදනය පිළිබඳ පුහුණුව, අතුරු නීති (Bylaw) සැකසීම පිළිබඳ පුහුණුව, මහජන සබඳතා පහසු කරන ආකාරයට කාර්යාල ක්‍රමවත් කිරිම පිළිබඳ පුහුණුව, පරිගණකකරණය මාධ්‍ය කටයුතු යනාදී වශයෙන් ක්ෂේත්‍ර බොහොමයක පුහුණුව පුර නැගුම වැඩසටහන අපට ලබා දුන්නා. මේ පුහුණුවේ ප්‍රයෝජන පුර නැගුමට පමණක් සීමා නොවී ප්‍රාදේශීය සභා ක්‍රියාත්මක වනතාක්කල් මහජනතාවටත්, සේවකයන්ටත් ලැබේවියි ජෙයකරන් කියයි.

පදවිය ශ්‍රී පුර ප්‍රාදේශීය සභාවේ කළමනාකරණ සහකාර ලෙස කටයුතු කරන නිලාන් සාගර මැදවත්ත ලිපිගොනු සැකසීම (Document) මූල්‍ය (Finance) පිළිබඳ පුහුණුවත් ත්‍රිකුණාමලයේ USAID ආයතනයත් සමග එක්ව ප්‍රසම්පාදනය (Procurement) පිළිබඳ පුහුණුවක් ලැබුණු බව කියයි.

''ප්‍රසම්පාදනය ගැන අපට තිබුණේ සුළු දැනුමක් විතරයි. ඒත් දැන්නම් අපට ජාතික හා ජාත්‍යන්තර මට්ටමේ වුණත් ප්‍රසම්පාදන වැඩ කරන්න පුළුවන්. මේ පුහුණුවට මමත් ලේකම්වරයාත් තාක්ෂණික නිලධාරියත් සහභාගී වුණා'' යි සාගර මැදවත්ත තව දුරටත් කීවේය.

තමන් පුර නැගුම වැඩසටනකට සම්බන්ධ වී තවමත් ඒ හැටි කාලයක් නැතැයි කී කන්තලේ ප්‍රාදේශීය සභාවේ කළමනාකරණ සහකාර එන්.එච්.ඒ ධනුෂිකා ලක්මාලි 'පුර නැගුම යටතේ මම ග්‍රාම සංවර්ධන සැලසුම් ගැන පුහුණුවක් ලැබුවා. දවස් තුනක පුහුණුවක් ලැබුණා. මේ පුහුණුව ත්‍රිකුණාමල කළමනාකරණ පීඨයේදී අපට ලබාදුන්නා. ඒ පුහුණුවෙන් පස්සෙ දවස් තුනක් ගම්මානවලට ගිහිල්ලා CIRM මඟින් වැඩ බිමේ පුහුණුවක් ලැබුවා'යි ලක්මාලි කීවේය.

එසේම තමන්ට ජනතා පැමිණිලිවලට සවන්දීමේ ක්‍රමවේදය පිළිබඳ පුහුණුවක් ලැබුණු බව පවසන ලක්මාලි ''ඒකෙදි අපිට පැමිණිල්ලක් ලැබෙන කොටම ඒ පැමිණිල්ල සම්බන්ධයෙන් ක්‍රියාත්මක වෙන්නෙ කොහොමද, එතෙන්දි කරන්න ඕන මොනවද කියන දේවල් ගැන අපට පුහුණුවක් ලබලා දුන්නා. විශේෂයෙන් අදාළ ගැටලුව පිළිවෙළක් කරලා ඒක අයිති මොන දෙපාර්තමේන්තුවට ද කියන එක මුලින්ම අඳුරගන්නවා. ඒක පළාත් පාලන ආයතනයකට අයිති නම් අදාළ නිලධාරීන්ට භාර දෙනවා. එහෙම නැතිව වෙනස් දෙපාර්තමේන්තුවට අයිති ප්‍රශ්නයක් නම් ඒක අදාළ දෙපාර්තමේන්තුවට යවලා ඒ ගැන වාර්තා කරනවා''යි කීවාය.

පුර නැගුමෙන් සේවකයන්ට ලැබුණු පුහුණුවීම් නිසා ඔවුන්ගේ පෞද්ගලික හැකියාවන් වර්ධනය කරන්න හේතු වී තිබෙන අතරම, පළාත් පාලන ආයතන විසින් සපයන සේවාවන්ගේ තත්ත්වයද ඉහළ දමන්නට හේතු වී තිබෙනවාය යන සත්‍ය කිසිවෙකුටත් බැහැර කළ නොහැකිය.



■ දේවිකා ධපාලසංහම්

**උසස් හැදියා, සෘජු දැක්ම, අවංක චුවමනාව, බුද්ධිය හැකියාව, යන මේ ගුණාංග භාරතී නම් මහා කවියා දුටු නවීන ගැහැණියකගේ උසස් ලක්‍ෂණයෝය. මෙකී භාරතිගේ සිහිනය සැබෑ වන අයුරින් වත්මන් කාන්තාවන් සෑම ක්ෂේත්‍රයකම බැඩබලන තත්ත්වයක් ඇති වී තිබේ.**

# පුර නැගුම වැඩසටහනේ කාන්තා දායකත්වය





ශ්‍රී ලාංකේය කාන්තාවන්ගේ සියයට 93ක් සාක්‍ෂරතා ඥානයෙන් හෙබිය යන්න විශේෂයෙන් සඳහන් කළ යුතු කරුණකි. රාජ්‍ය අංශය පෞද්ගලික අංශය ආදී වශයෙන් සෑම ක්ෂේත්‍රයකම කාන්තා සහභාගිත්වය නැතිවම බැරි තත්ත්වයක් උදා වී තිබේ. ඊටත් අමතරව කාන්තාව සමාජ සේවයටත්, ග්‍රාමීය මට්ටමේ කටයුතුවලටත් දායකවීමේ වැඩි නැඹුරුවක් මෑතක සිට ඇති වී තිබේ.

නැගෙනහිර පළාතේ තෝරාගත් පළාත් පාලන ආයතනවල කුඩා නගර ආශ්‍රිත ප්‍රදේශ සංවර්ධනය කිරීමේ පුර නැගුම වැඩසටහනටත් කාන්තා සහභාගිත්වය නැතිවම බැරි දෙයක් බවට පත්ව තිබේ.

පුර නැගුම වැඩසටහනේ ජනතා සහභාගිත්ව සංවර්ධන සැලසුම් (Participatory Development Plan) යන්න වැදගත් අංගයකි. මෙහිදී ජනතාව විසින්ම තම අවශ්‍යතා හඳුනාගත යුතු වෙනවා. තමන්ගේ බොහොමයක් අවශ්‍යතා අතරින් වඩා වැදගත් අවශ්‍යතාව හඳුනාගෙන ඊට ප්‍රමුඛතාව ලබාදීම කළ යුත්තෙත් ඔවුන්ය. ඔවුන්ගේ සැබෑ ප්‍රශ්නවලට විසඳුම් ලැබෙන්නේ එවිටයි. මෙහි කාන්තා ප්‍රතිශතය ඔවුන්ගේ දායකත්වය භාවිතාව යන සියලුම කාරණා සැලකිල්ලට ගැනීම විශේෂයෙන් සඳහන් විය යුතුය.

පුර නැගුම වැඩසටහන මඟින් ක්‍රියාත්මක කෙරෙන සංවර්ධන වැඩසටහන්වලට තමන්ට හැකි විවිධාකාර සහයත් කාන්තාවන් විසින් ලබා දෙනු ලබයි. ඒ සෑම වැඩකදීම කාන්තා දායකත්වයට වැදගත් තැනක් හිමිවනවාය යන්න අතිශෝක්තියක් නොවේ.



මේ පසුබිම තුළ මේ වැඩසටහනේ සුළු සුළු අත් උදව් ලබා දීමේ සිට සෑම කාරණයකදීම වැඩිම දායකත්වයක් ලැබෙන්නේ කාන්තා පාර්ශ්වයෙනි. දායකත්වය කී සැනින් ඒ කාන්තා දායකත්වය යන්න දූන් පුර නැගුම වැඩ සටහන සමඟම බද්ධ වූ එකක් බවට පත්ව තිබේ.

මෙහිදී පුර නැගුම වැඩසටහනට ලැබුණු කාන්තා දායකත්වය කෙබඳුද යන පැනයට මේ ප්‍රදේශවලින් පුර නැගුමට ශක්තියක්ව ක්‍රියා කළ කාන්තාවන් කිහිප දෙනෙකුගේ අදහස් හෙළිදරව් කිරීම වැදගත් වනු ඇත.



කින්යා නගර සභාවේ මම ලේකම්වරියක් හැටියට ඉන්න එකම කාන්තාවනට ලැබුණු පිළිග ැනීමක් නේද? යන පැනය අප හමුවේ තබමින්ම ඇගේ අදහස් දක්වන්නට ඉදිරිපත් වූ කින්යා නගර සභාවේ ලේකම්වරිය වන යාලිනී නරේන්ද්‍රන් ''කාන්තාවන් ප්‍රජා මධ්‍යස්ථානවල සාමාජිකත්වය දරනවා. ඒ වගේම ග්‍රාම සංවර්ධන සංගම්වල සාමාජිකත්වය දරනවා. සැලසුම සවි ගැන්වීමේදී කාන්තා සහයෝගය ලැබිලා තියෙනවා. රැස්වීම්වල කාන්තා සහභාගිත්වය වැඩි වි තිබෙනවා. ඒ වගේම ඒ අය ඒ අයගේ අවශ්‍යතා අවධාරණය කරලා කතා කරනවා යි'' ඇය කීවාය.

මේ වැඩපිළිවෙළේ කාන්තා සහභාගිත්වය වැඩි වශයෙන් දකින්න ලැබෙනවා. විශේෂයෙන් කායික ශ්‍රමය ලබාදීමේදීත් කාන්තාවන්ගේ කැපී පෙනෙන තත්ත්වයක තිබෙනවා. පදවිය ශ්‍රී පුර ප්‍රාදේශීය සභා සභාපති එම්.ජී. තිලකරත්න මේ පිළිබඳ කතා කරමින් කියා සිටියේ තම ප්‍රදේශයේ ක්‍රියාත්මක කෙරුණු පානීය ජල ව්‍යාපෘතියේදී ප්‍රදේශයේ කාන්තාවන්ගේ දායකත්වය සියයට සියයක් වූ බවය.

තම්පලගම ප්‍රාදේශීය සභාවේ සභාපති සීනි මුහමඩ් සුපියාන් මේ ගැන අදහස් දක්වමින් ''සමාජ විගණන කමිටුවේ පවා අපි කාන්තා නියෝජනයට අවස්ථාවක් දීලයි තියෙන්නෙ. සැලසුම් හඳුනා ගැනීමේදී එයාලගෙ යෝජනාවලට ප්‍රමුඛතාව දීමේදී වැඩිම සහභාගිත්වයක් තියෙන්නෙ කාන්තා පාර්ශ්වයෙන්. අපි එයාලගෙ අදහස්වලට වැදගත් තැනක් දෙනවට අමතරව ඒවා ක්‍රියාත්මක කරන්නටත් අවස්ථාව උදා කරලා දෙනවා.'' යි කීවේය.

සංස්කෘතික හා සාම්ප්‍රාදායික බැඳීම් සමාජීය පාලනයන් යනාදිය සැලකිල්ලට ගෙන කාන්තාවන් තම සීමාවන් තුළ හිඳිමින් ක්‍රියාත්මක විය යුතුව තිබෙනවා. එය අනිවාර්යය දෙයක්. කාන්තාවනුත් එම තත්ත්වයන් මැනවින් තේරුම් අරගෙන එයට ගැළපෙන ආකරයට තම සීමාවන් තුළ රැඳෙමින්ම තමන්ට හැකි උපරිම සමාජය වෙනුවෙන් ඉටු කරනු දකින්නට ලැබෙනවා.

පුර නැගුම වැඩසටහනේ හිටපු නියෝජ්‍ය වැඩසටහන් සම්බන්ධීකාරක ඒ. පී. එම්. අසරෆ් මේ පිළිබඳ අදහස් දක්වමින් ''කාන්තාවන්ගේ දායකත්වය සැලසුම් සම්පාදනයේදීත්, වැඩ කිරීමේදීත් වැඩි වශයෙන් දකින්න ලැබෙනවා. ඒත් අපි මෙතැන්දි බලන්න ඕන තීරණ ගැනීමේදී කාන්තාවන්ගේ දායකත්වය මොන මට්ටමක පවතිනවද කියන කාරණය. ඒ වගේම සමාජ විගණන කමිටුවේ කාන්තා දායකත්වය ප්‍රායෝගික නෑ. ඒකට හේතුව එයාලගෙ තියෙන වැඩ රාජකාරි වැඩිකම, තාක්‍ෂණික දැනුමේ අඩුකම, සංස්කෘතික බාධක වගේ දේවල් මේකට හේතුවෙනවා. මේ පසුබිම තුළ කාන්තා දායකත්වයක් ලැබෙනවාය කියන එකට ලොකු දෙයක්. මේ කාරණා ඇරුණම කාන්තා දායකත්වයේ වෙන ගැටලුවක් නෑ.'' එසේ කියූ ඔහු ඉදිරි කාලයේදී කාන්තාවන් සැලකිල්ල දැක්විය යුතු කාරණා ගැන ඔහු පැහැදිලි කිරීමක් කළා.

ශ්‍රී ලංකාවේ ජනගහණයෙන් කාන්තා ප්‍රතිශතය 50%ක් වුණත් ප්‍රතිශතයට සාපේක්‍ෂව නායකත්වය වගේ කාරණාවලදී කාන්තා දායකත්වය තියෙන්නේ ඉතාම අඩු මට්ටමකයි. ඒ කෙසේ වෙතත් අද ඕනෑම ක්ෂේත්‍රයකම කාන්තා දායකත්වය අනිවාර්යයෙන්ම අවශ්‍යයයි කියන පසුබිම පුර නැගුම වැඩසටහන මඟින් ඇතිකර තිබෙනවාය යන්න පැහැදිලි ඇත්තක්.





■ සුභාෂිණී ලෝගනාදන්

## ජලය අපගේ පණට සමානයි

# පුර නැගුම යටතේ පානීය ජල සැපයුම



සෞඛ්‍ය සම්පන්න ජීවිතයකට පිරිසිදු පානීය ජලය අත්‍යවශ්‍යයයි. එහෙත් වත්මන් ලෝකයේ මිනිසාගේ විවිධ ක්‍රියාකාරකම් හේතුවෙන් ස්වභාවික සම්පතක් වන භූගත ජලය දූෂණය වී තිබේ. මේ නිසාම අද අපට පිරිසිදු ජලය ලබාගැනීමේදී අභියෝග රැසකට මුහුණ දීමට සිදුව තිබේ.

පුර නැගුම වැඩසටහන වෙනුවෙන් කන්තලේ ප්‍රාදේශීය සභාවට රුපියල් මිලියන 116.72 ක මුදලක් ලෝක බැංකු විසින් ලබාදෙන ලදී. එම මුදල් 2011 වසරේ ව්‍යාපෘතීන් 6ක්, 2012 වසරේ ව්‍යාපෘතීන් 3ක්, 2013 වසරේ ව්‍යාපෘතීන් 1 ක් වශයෙන් ක්‍රියාත්මක කිරිම සඳහා යොදවනු ලැබ තිබේ. මෙහි වෙසෙන ජනතාවගේ ප්‍රමුඛ අවශ්‍යතා වී තිබෙන්නේ ප්‍රවාහන, විදුලිය හා ජලය යනාදියයි.

කෘෂිකාර්මික ප්‍රදේශයක් වන කන්තලේ ජනයා පිරිසිදු පානීය ජලය ලබා ගැනීමේ දුෂ්කරතාවලට මුහුණ පා සිටිති. විශේෂයෙන් මෙම ප්‍රදේශයේ වකුගඩු රෝගයට ගොදුරු වූවන්ගේ ප්‍රමාණය විශාල බව කන්තලේ ප්‍රාදේශීය සභාවේ ලේකම්, රොහාන් දසනායක පෙන්වා දෙයි. මෙහි ජනතාවට පිරිසිදු පානීය ජලය නොලැබීම මෙයට හේතුව බව හෙළි වී තිබේ.

මේ පිළිබඳ අදහස් දක්වන කන්තලේ ප්‍රාදේශිය සභාවේ තාක්ෂණ නිලධාරී, ඒ.කේ.කේ. දමයන්ති ''මෙහේ මිනිස්සු සාමාන්‍යයෙන් පාවිච්චියට ගන්නෙ ළිං වතුර. ඒත් ළිං වතුරෙන් ලෙඩ හැදෙන හින්දා ළිං වතුර පාවිච්චියට ගන්ඩ එපාය කියලා අපි උපදෙස් දීලා තියෙනවා.'' කීවාය.

වතුර නැතිව ගොඩක් දුක්විඳින මෙහේ මිනිස්සු කිලෝමීටර භාගයක් විතර පයිං ගිහිල්ලයි වතුර ගෙනාවෙ. මේ නිසා මෙහේ මිනිස්සුන්ගෙ ප්‍රධානම ප්‍රශ්නයක් වෙලා තිබ්බ පානීය ජල ප්‍රශ්නය විසඳන්න කන්තලේ ප්‍රාදේශීය සභාව කටයුතු යෙදුවා. මේකයි ප්‍රදේශයේ ජනතාවගේත් ප්‍රමුඛ අවශ්‍යතාව වුණේ. මේ නිසා යෝධ ඇල ප්‍රදේශයේ ජනතාවට පුර නැගුම වැඩසටහන යටතේ ජල සැපයුම් ව්‍යාපෘතියක් ලබා දුන්නා

නළ ජලය ලැබීමට පෙර තමන් මුහුණ පෑ දුෂ්කරතා ගැන කියන අල්තාරින් පාරේ පදිංචි 35 හැවිරිදි ඊ.එම්. වෂීර් කිව්වෙ මීට කලින් අපි ගොඩක් දුක්වින්දා. ළිදෙන් තමයි වතුර ගත්තෙ. ළිඳක් තිබිලත් වතුර බොන්ඩ පුළුවන්කමක් තිබ්බෙ නෑ. ළිදෙන් කෘමීන්, මදුරුවො, ඇතිවෙනවය කියලා ඒක වහලා දාන්ඩය කියලා කිව්වා.

පුර නැගුමෙන් තමන්ට පානීය ජලය ලැබීම විශාල වරප්‍රසාදයක් ලෙස සලකන මෙහි ජනතාව ඊට කෘතවේදීත්වය පළ කරන්නටත් අමතක කළේ නෑ. මේ ගැන අදහස් කිව්ව 32 හැවිරිදි රහ්මා බීම්/රිහානා ''දැන් අපි හැමදේටම පාවිච්චි කරන්නෙ පයිප්ප වතුරයි. විශේෂයෙන්ම බොන්ඩ ගන්නෙ ඒකෙන් අපිට වතුර ගන්ඩ රුපියල් 28,000/- වියදම් වුණා'' යි කීවාය.

මේ වන විට වර්ග කිලෝමීටර 650ක පදේශයකට පානීය ජලය සපයා ඇති බව පවසන තාක්ෂණික නිලධාරිණී ඒ.කේ.කේ. දමයන්ති මේ මඟින් පුද්ගලයන් 3500කට සෙත සැලසී ඇතැයි පවසයි. මෙහි ජනතාව අත යහමින් මුදල් නැතිකම හේතුවෙන් පෞද්ගලික මට්ටමෙන් ඔවුන්ට නළ ජලය ලබා ගැනීමට නොහැකි වී ඇතැයි ද නළ ජලය ලබා ගැනීමට එක පවුලකට අවම වශයෙන් රුපියල් 15,000/- 17000/- අතර මුදලක් ජලසම්පාදන මණ්ඩලයට ආරම්භක ගාස්තු ලෙස ගෙවීමට සිදු වන බවත්, එහෙත් එය සම්පූර්ණයෙන් ගෙවීමේ හැකියාව මේ ජනතාවට නැති බවත් ඇය පවසයි.

තවමත් ලබා ගන්නා ජලය සඳහා ජල ගාස්තුවක් නොවන හෙයින් අසල්වැසියන් ද පැමිණ ජලය ලබාගන්නා බව රහ්මා බීවී පවසයි.

''තවම ජල සම්පාදන මණ්ඩලයෙන් ගාස්තු අයකරන්න ගත්තෙ නෑ. මාස හතරක් පහක් ගියාට පස්සෙ තමයි ගාණක් එකතු කරන්නෙ. ළඟපාත ගෙවල්වල අයත් වතුර ගන්න හින්දා ගාස්තුව අයකරන දවසට ගෙවා ගන්ඩ අමාරුවෙයි. ඒත් ඉතිං වතුර ටිකක් ඉල්ලගෙන එන කෙනෙකුට බෑ කියන්ඩත් බැනෙ නේද?'' යි දමයන්ති ප්‍රශ්නයක් ද මතු කරයි.